# වැඩිහිටි භාවය සහ සමාජ භර

ඒ.කේ.ජී. ජයසිංහ
B.A (ගෞ.) M.A. (සංවර්ධන සමාජ විද්‍යාව)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - සමාජවිද්‍යා අංශය, රුහුණ විශ්වවිද්‍යාලය

විය පත්වීම යනු මිනිසාට පමණක් නො ව සියලු සත්ව වර්ගයාට ම පොදු වූ ධර්මතාවය කි. මීට වසර පනහකට පමණ පෙර අවදිය දෙස ආපසු හැරී බැලුව හොත් ලෝකයේ සමාජවිද්‍යාඥයින් මහලු විය පිළිබඳ ව විශේෂ අවධානයකින් කථා නොකර ලද බව ද පෙනේ. එසේ වුව ද මේ වන විට පෙර අපර දෙදිග ලෝකයේ සමාජ විද්‍යාඥයින් හට වයෝවෘද්ධ භාවය යනු ඉතා වැදගත් විෂයානුබද්ධ මාතෘකාවකි, එය මේ වන විට සමාජ ගැටළුවක් බවට පත් වී ඇති හෙයින් සමාජවිද්‍යාඥයින් ඒ කෙරේ විශේෂ අවධානයක් යොමු කරනු දක්නට ලැබේ. විශේෂයෙන් ම 20 වන සියවසේ අවසන් පනස් වසර ඇතුළත සමාජ ආර්ථිකමය වශයෙන් ලෝකයේ සිදු වූ වෙනස්වීම්වල අතුරු ප්‍රතිවිපාකයක් ලෙස වයෝවෘද්ධ භාවය සමාජ ගැටළුවක් බවට පරිවර්තනය විය. බොහෝ නවීන සමාජ අර්බුද මෙන්ම මෙම ගැටළුව ද ජන්ම ලාභය ලබනුයේ බටහිර දියුණු යැයි සම්මත සංකීර්ණ නාගරික නවීන කාර්මික සමාජවල යි. බටහිර ලෝකයට සමානුපාතික කාර්මීකරණයක් ආසියාතික හෝ අප්‍රිකානු රටවල ඇතිවන්නේ නැත. එහෙත් කාර්මීකරණයේ නොමඳ බලපෑම මෙකී කලාපවලට ද ව්‍යාප්ත වේ. එහි ප්‍රතිඵලයක් ලෙස මෙකී කලාපවලට අයත් වූ රටවල ද සමාජ ආර්ථිකමය වශයෙන් බොහෝ වෙනස් කම් ඇති වේ. මෙම සමාජ ආර්ථික වෙනස්කම් හා සමගින් අප වැනි රටවල ද විවිධ සමාජ ගැටළු උද්ගත වීම නව අත්දැකීමක් විය. වයෝවෘද්ධ භාවය ද එම ප්‍රවාහයට එක්වූ නවත්

අත්දැකීමක් ලෙස හැඳින්විය හැකි වේ. වයෝවෘද්ධ භාවය නැමති සමාජ සංසිද්ධිය ඉතා සියුම් ලෙස ක්‍රමයෙන් සමාජ ගැටළුවක තත්ත්වයට අප රටවල ද වර්ධනය වෙමින් පවත්නා බව පෙනී යයි. ගෙවීගිය වසර 25ක පමණ කාලය දෙස බලන විට අප රටෙහිද වැඩිහිටි නිවාස ප්‍රමාණය මෙන් ම ඒවායෙහි රැකවරණය පතා පැමිණෙන වැඩිහිටියන් ප්‍රමාණයද සංඛ්‍යාත්මක වශයෙන් ඉහළ ගොස් ඇති බව ඉතා පැහැදිලිව දැකිය හැකි වේ. වැඩිහිටියන්හට සැලකීමේ හා රැකවරණය සැලසීමේ පාරම්පරික ක්‍රියාදාමය ද බටහිරකරණය වෙමින් පවත්නා බව ඒ දෙස විමැසිල්ලෙන් බලන විට මැනවින් පැහැදිලි වේ.

ක්‍රි.පු. 3 වන සියවසේ සිට මෙරට ස්ථාපනය වන බෞද්ධ ශිෂ්ටාචාරයෙහි කේන්ද්‍රීය හර පද්ධතියට දෙමාපිය වැඩිහිටියනට ඇප උපස්ථාන කිරීම හා ගරු සැලකිලි දැක්වීම ද ඇතුළත් විය. මහා මංගල සූත්‍රයෙහි **මාතා පිතු උපට්ඨානං** යනුවෙන් දක්වා ඇත්තේ ඒ සඳහා වූ මග පෙන්වීම යි. වියපත් මා පියනට ඇප උපස්ථාන කිරීම යමෙකුගේ එලොව ජීවිතයට මෙන් ම මෙලොව ජීවිතයට ද වැඩදායක වූ මහා පුණ්‍යකර්මයක් මෙන් ම සත් ක්‍රියාවක් ද වන බව බුද්ධ දේශනාවේ විවරණය කොට ඇත. ඒ කෙසේ වුව ද බටහිර රටවල ඇති සෑම ව්‍යාධියක් මෙන් ම වයෝවෘද්ධ භාවය හා සම්බන්ධ සමාජ අත්දැකීම් ද අප වැනි රටවලට විසරණය වීමට පටන්ගන්නා ලදී. වැඩිහිටි නිවාස ප්‍රමාණය හා ඒවායේ රැකවරණය සොයා පැමිණෙන්නන්ගේ සංඛ්‍යාව වේගයෙන් ඉහළ යාමෙන් තහවුරු වන්නේ අප සිංහල බෞද්ධ ජීවන ප්‍රතිපදාවෙන් ඈත් වී බටහිරකරණයේ ගොදුරු බවට පත් වෙමින් සිටින බවයි. කෙසේ වුව ද මෙරට සමස්ත ජන සංඛ්‍යාවට සාපේක්ෂ ව සලකා බලන විට වැඩිහිටියන් හා සම්බන්ධයෙන් දක්වන කාරුණික ගරු සත්කාර පිළිබඳ තවමත් සෑහීමට පත්විය හැකි ය. විශේෂයෙන්ම බටහිර පන්නයට හිතන හා ජීවත්වන නාගරික මධ්‍යම පන්තියෙන් ඉහළ තලයේ අතලොස්සක් දෙනා පමණක් වැඩිහිටි භාවය ලඝුකොට සලකමින් මෙවැනි ප්‍රතිචාරයක් දක්වනු ලැබේ.





බටහිර සංස්කෘතික හර දේවත්වයෙන් සලකන මෙරට අතලොස්සක් දෙනා පන්ති විලාසිතාවක් ලෙස ස්වකීය වියපත් දෙමාපිය වැඩිහිටියන් එක්කෝ නොසලකා හරිති. නැතහොත් වැඩිහිටි නිවාසවල හිරකර තබති. එහෙත් තවමත් රටේ මුළු ජනගහනයෙන් සියයට හැත්තෑවකටත් වඩා වැඩි ග්‍රාමීය සාමාන්‍ය ජනතාව සිය වයෝවෘද්ධ දෙමාපිය වැඩිහිටියන් කවා පොවා රැක බලා ගනු ලබන්නේ ඉතාමත් ඕනෑකමිනි. ඒ කෙසේ වුව ද මේ වන විට මෙරට අතළොස්සක් ඉහළ පැළැන්තිකයන්ගේ බටහිරකරණය වූ සංස්කෘතිය හරහා ප්‍රචලිත වීමට මුල පුරා ඇති මෙකී සදාචාර විරෝධී ක්‍රියා කලාපය පිළිබඳ දැඩි සේ සැලකිලිමත් විය යුතු වේ. සදාචාර සම්පන්න සමාජ ක්‍රමයක් පිළිබඳ සදාතනික සිහිනයක් දකින සියලු දෙනා මෙම තත්ත්වය ලඝුකොට නොසලකා දැඩි අවධානයට ගත යුතු වේ. කිසියම් සමාජයක ඉහළ ස්ථරවලට පළමු කොට වැළඳෙන ඕනෑම හොඳ හෝ නරක විලාසිතාවක් කාලයාගේ ඇවෑමෙන් පහළ ස්ථර වෙත ද ව්‍යාප්ත වීමේ අවදානමක් පවත්නා හෙයිනි.

සාම්ප්‍රදායික සිංහල සමාජ සංවිධානය ඉතාමත් සැලසුම් සහගත ස්වරූපයකට සැකසී තිබූ බව පසක් වේ. එම සමාජ සංවිධානයෙහි සෑම අවස්ථාවක දී ම වැඩිහිටි බවට හා ඔවුන්ගේ මග පෙන්වීමට ප්‍රමුඛස්ථානය හිමි විය. බොහෝ විට මරණය දක්වා ම වැඩිහියාගේ සමාජීය වටිනාකම නො වෙනස් ව පැවතිනි. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය ම ජීවිත කාලය මුළුල්ලෙහි හොඳින් කය වෙහෙසා එදිනෙදා ජීවිතයේ විවිධ කටයුතු වල නිරත විය. වයස්ගත වීමත් සමඟ ම සාමාන්‍ය ජීවිතයේ සුපුරුදු වැඩ කටයුතු වලින් ඉවත් වුවහොත් තමන් ඉක්මනින් අබල දුබල වී රෝගාතුර වෙතැයි ඔවුහු කල්පනා කලහ. එබැවින් බොහෝ විට වයස අවුරුදු 80 ක් හෝ 90 ක් වුව ද ඔවුන් කායික හා මානසික වශයෙන් ඉතාමත් නිරෝගී හා ශක්තිමත් විය. එබැවින් ඒ දක්වා ම වැඩිහිටි පිරිමි සාමාජිකයින් අන්‍යයන් හා සමඟ එක් ව ගොවිතැන් ඇතුළු විවිධ කටයුතු වල නිරත විය. එමෙන් ම වයෝවෘද්ධ කාන්තාවන් ද ඉවුම් පිහුම් කටයුතුවල නිරත විය.

ධාන්‍ය ය කෙටීම පෙළීම වැනි තරමක් වෙහෙසකර කටයුතුවල ද නිරත වනු දක්නට ලැබිණි. ඒ හැරුණු විට පැදුරු මලු වට්ටි පෙට්ටි වැනි ගැමි ජන ජීවිතයට අත්‍යවශ්‍ය වූ ආම්පන්න නිෂ්පාදනය කිරීම බොහෝ විට සිදු වුයේ ද මෙවැනි වියපත් කාන්තාවන් අතිනි. මෙයින් පැහැදිලි වන්නේ වයස අවුරුදු 55 හෝ ඒ ආසන්නයේ දී මිනිසුන් කිසිවක් කළ නොහැකි බෙලහීනයන් බවට පත් නොවන බවයි. මෙම තත්ත්වය අප රටෙහි පමණක් නොව ඇමෙරිකා එක්සත් ජනපදය වැනි රටවල ද දක්නට ලැබේ. ඒ බැව් විවිධ පර්යේෂණවලින් තහවුරු කොට දක්වා ඇත. කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ වෘද්ධවේදය (Gerontology) පිළිබඳ විශේෂඥයෙකු වූ **ජේම්ස් පීටර්සන්** සිය පර්යේෂණ මාර්ගයෙන් ඒ හා සම්බන්ධ ඉතා වැදගත් තොරතුරු රැසක් හෙළි දරව් කරන ලදී. වැඩිහිටියන් අතුරින් සියයට 90 ක් ම ඉතා හොඳ සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවන මුළු ජනගහනයෙන් සියයට 5 ක් පමණ දෙනෙකු පමණක් ආරෝග්‍ය ශාලාවක ප්‍රතිකාර ලබන තත්ත්වයෙහි පසුවන බව ද පීටර්සන් තව දුරටත් සිය අධ්‍යයන වලින් පෙන්වා දෙන ලදී.

ආතර් **ශොස්ටැක්** හා **ෆ්‍රෑන්ක් මැක්වෙයි** යන දෙදෙනා විසින් පෙන්වා දෙන ලද ආකාරයට බටහිර සමාජ ආකෘතියෙහි වයෝවෘද්ධයන් ජරාපත් වූ පිරිසක් ය යන පොදු හැඟීමක් පවතී. එමෙන් ම ඔවුන් ආර්ථිකමය වශයෙන් ඉතා දුප්පත් තත්ත්වයක පසුවන බවත් කිසිදු නිෂ්පාදන හැකියාවක් නොමැති බවත් තව දුරටත් දක්නට ලැබෙන පොදු සමාජ ආකල්පයන් ය. වැඩිහිටියන් හා සමඟින් පවත්නා සමාජ සම්බන්ධතාවයේ සැබෑ ස්වරූපය මේ සියලු අභ්‍යුපගමනයන්ගෙන් පැහැදිලි වන්නේය. කිසියම් සමාජයක් සදාකාලික ව එහි සාමාජිකයාගෙන් ලාභ ප්‍රයෝජන පමණක් අපේක්ෂා කරන්නේ නම් මෙවැනි ගැටළු පිළිබඳ අවධානය යොමු කිරීමට සිදු වේ. මානව සමාජය ශක්තිමත් ව ගොඩ නංවා ගැනීමේදී මෙන් ම එය අඛණ්ඩ ව ගලා යන ප්‍රවාහයක් හැටියට ආරක්ෂා කර ගැනීමේදීද වඩාත් වැදගත් වන්නේ අයිතිවාසිකම් වලට වඩා වගකීම් හා යුතුකම්ය. සාම්ප්‍රදායික සිංහල සමාජය සැලකිල්ලට ගත හොත් එහිදී වැඩිහිටියා යනු වෙනස් නො වන





අගයක් හිමි වටිනා සම්පතක් හැටියට සලකා ඇත. කිසියම් සමාජයක ඕනෑම අවස්ථාවකදී බොහෝ ඇසු පිරූ තැන් ඇති තැනැත්තා ලෙස ගරු බුහුමන් ලැබුයේ වැඩිහිටි සාමාජිකයා ය. ඔව්හු ගුණ ධර්ම අතින් ද පොහොසත්තු වූහ. ඇවතුමෙන් පැවතුමෙන් මග පෙන්වීමෙන් ස්වකීය බහුශ්‍රැත බව ප්‍රායෝගික ව ඔප්පු කරනු ලැබි ය. එබැවින් සාම්ප්‍රදායික සිංහල සමාජය වියපත් වූ දෙමාපිය වැඩිහිටියන් ගෞරව සම්ප්‍රයුක්ත ව ආරක්ෂා කර ගන්නා ලදී. ජීවිතයේ අතරමඟ දී ඔවුන් අත් නො හරිනු ලැබී ය.

එමෙන් ම **මැක්වෙයි** හා **ශොස්ටැක්** යන දෙදෙනා විසින් තව දුරටත් පෙන්වා දෙන ලද්දේ අසහනය දැඩි කනස්සල්ල හා කාන්සාව වැනි මානසික ගැටලු වියපත් පුද්ගලයින් ඉතා වේගයෙන් ජරාපත් බෙලහීන රෝගීන් බවට ලක් කිරීමට හේතු වන ප්‍රබලතම සාධකයන් වන බවයි. වත්මන් බටහිර නවීන දියුණු යැයි සම්මත සමාජවල වැඩිහිටි නැතහොත් විශ්‍රාමික වයසට පත් වූවත් නො සලකා හැරීම ඉතා සුලභ පොදු ධර්මතාවක් බවට පත් වී ඇත. යාන්තම් තරුණ වියට පා ඔසවන දූ දරුවන් ස්වකීය ජීවිතවලට දෙමාපියන්ගේ මැදිහත්වීම තදින් ප්‍රතික්ෂේප කරමින් විරෝධය දක්වනු ලැබේ. කෙනෙකුට සිය අභිමතය පරිදි නිදහස් ජීවිතයක් ගත කිරීමට ඉඩ සලසා දීම එම තැනැත්තාගේ මූලික අයිතීන් හා එකඟ වීමක් බව පොදුවේ බටහිර සමාජ විසින් පිළිගනු ලැබේ. මෙකී මුලධර්මයේ ප්‍රතිවිපාක එතරම් සතුටුදායක නොවූ බව ටිකින් ටික තහවුරු වන්නට විය. ඒ අනුව මේ වන විට එම සමාජවල දෙමාපිය දූ දරු සම්බන්ධතාවයන් ඉතා බැරෑරුම් අභියෝගයකට මුහුණ පා ඇති අයුරු දක්නට ලැබේ. දෙමාපියන් හා දූ දරුවන් අතර අන්‍යෝන්‍ය බැඳීම දරුවාගේ ළා බාල වයසට පමණක් සීමා වීම එහි අවසන් ප්‍රතිඵලය වී ඇත. එම සමාජවල විවාහය වැනි තීරණාත්මක සමාජ සම්බන්ධතාවයන් පවා ඉතා ලිහිල් ගනුදෙනුවක තත්ත්වයට පත් වී ඇත. අත්දැකීම් බහුල දෙමාපිය වැඩිහිටියන්ගේ අනු දැනුමකින් තොර ව කෙනෙකුගේ ජීවිතයට අතිශය තීරණාත්මක එවැනි සම්බන්ධතාවන් හා සම්බන්ධ තීරණ පවා හැඟීම් වලට පමණක් වහල් වී ගැනීමේ ප්‍රතිඵලය ලෙස එක් අතකින් විවාහ සංස්ථාව දැඩි අස්ථාවර

තත්ත්වයකට පත් වී ඇත. අනෙක් අතින් දෙමාපිය දූ දරු බැඳීම් බොහෝ දුරට පිරිහී ගොස් ඇති හෙයින් තරුණ හෝ මැදි වියට පත් වන විට කෙනෙකුට සිය දෙමාපියන් පහසුවෙන් අමතක කර දැමීමට හැකිවනු ඇත. උපන් දිනය නත්තල හෝ අළුත් අවුරුදු උදාව වැනි විශේෂතම අවස්ථාවන්හිදී තැපැලෙන් මල් කළඹක් එවීමෙන් සෑහීමට පත්වන මට්ටමට බටහිර සමාජවල දෙමාපිය දූ දරු සම්බන්ධතාවන් මේ වන විට බිඳ වැටී ඇත. ප්‍රංශය, ජර්මනිය, මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකාව වැනි රටවල මහල් නිවාස සංකීර්ණ කාමරයක් තුළ කාත් කවුරුවත් නොමැති හුදකලා වූ වැඩිහිටියන් කිසිවෙකු හෝ නොදැන ජීවිතක්ෂයට පත් ව කුණු වී යන අවස්ථා ඉතා සුලභ ය. අවසන් වශයෙන් කුණු ගඳ ගසන පිළිකුල් වූ මෘත දේහය මිහිදන් කිරීමේ වගකීම කිසිදු සම්බන්ධතාවයක් නැති රජයේ නිලධාරීන්ගේ කර මත පැටවේ. ඒ අයුරින් අවසන් ගමන් යන වැඩිහිටියන් වෙනුවෙන් අවමඟුල් පෙරහැරවල් නොමැත. හඬා වැලපෙමින් නිසල දේහය පසුපස ගමන් ගැනීමට ද කෙනෙක් නැත. මිනිස් වර්ගයා විසින් වසර සිය දහස් ගණනක් තිස්සේ මහත් පරිශ්‍රමයෙන් ටිකින් ටික ඉදිකළ මහා ශිෂ්ටාචාරයේ අවසන් අදියර මේ අයුරින් ආරම්භ වන්නේ යැයි කිව හොත් එය අතිශයෝක්තියක් නො වනු ඇත.

මෙලෙස නිවෙස් තුළ හෝ මහා මාර්ගවල හුදකලා වී අසරණ වන වැඩිහිටියනට අසහනය දැඩි කණස්සල්ල හා කාන්සාව වැනි මානසික ගැටළු ඇතිවීම කොතරම් ස්වාභාවික වන්නේ දැයි පැහැදිලි වේ. පංචකාම සැප සම්පත් කොතරම් තිබුන ද නීරෝගී මිනිසෙකු වීම සඳහා සොම්නසින් පිරි මනසක් ඒ සියල්ලටම වඩා තීරණාත්මක වන බව නවීන වෛද්‍ය විද්‍යාවේ ද නිගමනයයි. බටහිර දියුණු යැයි සම්මත සමාජවල මිනිස්කම හැරුණ විට අනෙක් සියළු භෞතික සම්පත්වලින් පිරී ඉතිරී ගොස් ඇතැයි කිව හොත් එය ද සාවද්‍ය නො වේ. සීමාන්තික ව භෞතික සම්පත් පසු පස හඹා යමින් අධ්‍යාත්මික ගුණ ධර්ම නො තකා හැරීම යනු මානව ශිෂ්ටාචාරයේ අවසානයේ ආරම්භයයි. මෙතෙක් මානව ශිෂ්ටාචාරය





වටකරගෙන ආරක්ෂා කළ සම්පව ඇති සෙයක් අප ඇස් ඉදිරිපිට සිදුවෙමින් පවත්නා මෙවැනි මිනිස් හැසිරීම්වලින් දිස් වේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් 1998 දී කරන ලද අධ්‍යයනයකට අනුව මීළඟ සිය වසේ දී ලොව මෙතෙක් ජීවත් වූ මානව වර්ග තුනක් මිහි තලයෙන් වඳ වී යාමේ තර්ජනයට මුහුණ පා ඇත. රතු ඉන්දියානුවන්, ඇස්කිමෝවරුන් හා සිංහලයින් යනු එම මානව වර්ග තුනයි. වසර දෙදහස් පන්සියයකටත් වඩා දීර්ඝ අභිමානවත් ශිෂ්ටාචාරයකට හිමිකම් කියන සිංහලයා මෙවන් ඉරණමකට මුහුණ පා ඇත්තේ කවර හේතු මතද යන ගැටළුව උද්ගත වේ. මේ වන විට ද තමන්ගේ කම ලඝු කොට සලකමින් බටහිර ලෝකයෙන් පැමිණෙන ඕනෑම විලාසිතාවක් විචාරයකින් තොර ව ඉස් මුදුනින් පිළිගන්නා දීන මානව වර්ගයක් බවට පත් වී තිබීම ඊට හේතුව යි. වයෝවෘද්ධ දෙමාපිය වැඩිහිටියන් සම්බන්ධයෙන් පැවති අපගේ පාරම්පරික ඇවතුම් පැවතුම් ගරු සත්කාර ද මෙකී බටහිර කරණයට හසුව සෝදා පාළුවට පත් වෙමින් පවත්නා බව මේ වන විටත් යම් තාක් දුරකට හෝ පෙනෙන්නට ඇත. වයෝවෘද්ධ අය සමාජයට අනවශ්‍ය වූ නො වැදගත් පිරිසක් ය යන බටහිර ආකල්පය දැන් දැන් ඉතා වේගයෙන් ශ්‍රී ලාංකික සමාජයෙහි ද ව්‍යාප්ත වෙමින් පවතී. කාර්ය බහුල යැයි කියනු ලබන නාගරික සමාජවල වෙසෙන වැඩිහිටියන් එක්කෝ නො සලකා හරින ලද තත්ත්වයකට පත් වී ඇත. නැතහොත් වැඩිහිටි නිවාසවල සිරගත කර ඇත. ඒ අතර ම ජන විද්‍යාඥයින් මෙන් ම සමාජ විද්‍යාඥයින් ද සංඛ්‍යා ලේඛන හරඹයක යෙදෙමින් වර්ධනය වෙමින් පවත්නා වූ මෙම ව්‍යසනය සාධාරණීකරනය කරනු දක්නට ලැබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් 1999 දී ප්‍රකාශයට පත් කළ වාර්තාවකට අනුව 2031 වන විට මෙරට වයස අවුරුදු 60 ඉක්ම වූ ජනගහනය සියයට 22.4 ක් දක්වා ඉහළ යතැයි පෙන්වා දී ඇත. මේ සා විශාල වයෝවෘද්ධ ජනගහනයක් නඩත්තු කිරීම ඉතා විශාල අභියෝගයක් ලෙස හුවා දක්වනුයේ මෙකී සංඛ්‍යාත්මක තොරතුරු පදනම්

කර ගනිමිනි. එහෙත් මෙය විශේෂ හේතු මත ඇති වූ ඉතාමත් තාවකාලික තත්ත්වයක් පමණක් වන බව අමතක නො කළ යුතු ය. මෑත ඇති වූ ඉතාමත් තාවකාලික තත්ත්වයක් පමණක් වන බව අමතක නො කළ යුතු ය. මෑත ඉතිහාසයේ දී විශේෂයෙන් ම තුන්වන ලෝකයේ රටවල කෘතිම ආකාරයෙන් ප්‍රජා විද්‍යාත්මකජනගහන සංක්‍රාන්තියක් ඇති කර ගැනීමට උනන්දුවක් දක්වන ලදී. එකී සංක්‍රාන්තියේ අත්දැකීම් පළමුවෙන් අත් විඳින රට ශ්‍රී ලංකාවයි. මෙහි දී එක් අතකින් කෘතිමාකාරයෙන් උපත් පාලනයට විවිධ පියවර ගන්නා ලද හෙයින් උපත් අනුපාතිකයේ සීඝ්‍ර පහත වැටීමක් වාර්තා විය. ඒ හා සමගම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මෑත කාලීනව ඇති වූ දියුණු ව හේතු කොට ගෙන පුද්ගලයාගේ ආයු කාලය ඉහළ ගියේ ය. 1946 දී උපතේදී අවුරුදු 42.2 ක්ව පැවති ආයු අපේක්ෂා ව 1991 වන විට 69.9 දක්වා වර්ධනය වීමෙන් ඒ බැව් තහවුරු වේ. මෙහි ප්‍රතිඵලය ලෙස 1970 දී පමණ උප්පත්තිය ලැබුවත් 2031 වන විට වයස අවුරුදු 60 ඉක්ම වූ විශ්‍රාමිකයන් බවට පත් වනු ඇත. එකී වයෝවෘද්ධ ජනගහනයේ උත්පත්තිය හදිසියේ ඇති වන බලපෑමක් නො වන්නේ නම් 1960,1970 ගණන් වන විට මෙරට සිදු වන වෙනස් කම්වල ප්‍රතිඵලය ලෙස මෙකී තත්ත්වය නිත්‍ය වශයෙන් අපේක්ෂා කළ යුතු බව ඕනෑම කෙනෙකුට ඉතා පැහැදිලිව තේරුම් ගත හැකි වනු ඇත. එබැවින් කළ යුතුව තිබුනේ අනාගත අභියෝගයට සාර්ථක ලෙස මුහුණ දීමට හැකිවන අයුරින් යෝග්‍ය පියවර කල් වේලා ඇතිව සූදානම් කර ගැනීමයි. කෙසේ වෙතත් මෙහි සැබෑ තත්ත්වය සංඛ්‍යා ලේඛනවලින් හුවා දක්වන තරම් භයානක නැතහොත් අභියෝගාත්මක නොවන බවද ඉතා පැහැදිලි ය. එක් අතකින් මෙලෙස වයෝවෘද්ධ භාවයට පත්වන ජනගහනය අප සමාජයට සදාකාලික බරක් වෙමින් ජීවත් නොවනු ඇත. අනෙක් අතින් ඒ සියලු දෙනා මේ වන විටත් ඔවුන්ගේ වයෝවෘද්ධ අනාගතය වෙනුවෙන් ආයෝජනය කරමින් සිටිති. කෙනෙක් කෙත් වත් අස්වද්දති. තවත් කෙනෙක් රටට සේවය කරමින් විශ්‍රාම වැටුප් උපයති. නැතහොත් අර්ථසාධකය පෝෂණය කරති. ඔවුනට ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම පමණක්





වගකිව යුතු පාර්ශවවලට පැවරී ඇත. ඒ හැරුණු විට රටේ යැපුම් සීමාවේ පසුවන වයස අවුදුරු 0-14 අතර ළමා ජනගහනය ද 1970 දශකය පමණ වන විට පැවති ප්‍රමාණයට වඩා බෙහෙවින් පසුකාලයේදී අඩු වී ඇත. සංගණන තොරතුරුවලින් තහවුරු වන ආකාරයට 1963 වන විට ශ්‍රම හමුදාවේ එනම් අවුරුදු 15-59 අතර වයස් කාණ්ඩයේ සාමාජිකයින් සිය දෙනෙකුට වයස අවුරුදු 0-14 ක් අතර ළමා ජන අනුපාතය 79.0 ක් විය. 1971 වන විට එම ප්‍රමාණය 71.3 දක්වා මද වශයෙන් පහත වැටිනි. දිගින් දිගටම ළමා ජන අනුපාතය මේ අයුරින් පහත වැටෙන අතර අප විසින් සලකා බලනු ලබන 2031 වන විට එය 24.6 සීමාවෙහි පවත්නා බව ප්‍රක්ෂේපණය කොට ඇත. එමෙන්ම 1963 වන විට ශ්‍රම හමුදාවේ සෑම සිය දෙනෙකුට ම වයස අවුරුදු 60 ට වඩා වැඩි ජන සංඛ්‍යාවේ අනුපාතය 11.4 ක් විය. 2031 වන විට එකී අනුපාතය 35.6 දක්වා වර්ධනය වනු ඇත. 1963 වන විට වයස අවුරුදු 0-14 දක්වා වුත් 60 හෝ ඊට වැඩිවුත් ජන සංඛ්‍යාවේ එකතුව නැතහොත් මුළු යැපුම් ජන අනුපාතය 60.2 ක් දක්වා පහත වැටෙන බව පෙනේ. මෙම තොරතුරුවලින් තහවුරු වන්නේ විසිවන සියවසේ අවසන් භාගය වන විට පැවති යැපුම් අනුපාතයට වඩා බෙහෙවින් සතුටු දායක තත්ත්වයක් 2031 වන විට ශ්‍රී ලංකාව තුළ පවත්නා බවයි. එහෙයින් වයෝවෘද්ධභාවයට පත් වූ ජන සංඛ්‍යාව හේතු කොට ගෙන ඇතැමුන් පෙන්වා දෙන අයුරින් ඉතා විශාල සමාජ ආර්ථික අභියෝගයකට මුහුණ පෑමට සිදු නොවන බව ඉතා පැහැදිලි ය.

සමාජ සුභ සාධනය යනු සදාතනික සාමාජීය අවශ්‍යතාවයකි. එය අන්‍යෝන්‍ය ක්‍රියාවලියක් ලෙස චක්‍රානුසාර ව පරපුරෙන් පරපුරට මානව සමාජය හා සමඟින් අත්වැල් බැඳගෙන ඉදිරියට ගමන් ගනු ලැබේ. ජව සම්පන්න තරුණ හා මැදි විය පසුකරනු ලබන ස්ත්‍රී පුරුෂ සාමාජිකයින් දෙමාපිය වැඩිහිටියන් හැටියට ළා බාල දූ දරුවන්හට කවා පොවා ආරක්‍ෂාව සලසා රැක බලා ගනිමින් යහ මගට යොමු කරවනු ලැබේ. ශිෂ්ටාචාරය අඛණ්ඩ ව ගලා යන්නට නම් මෙය අත්‍යවශ්‍යයෙන් සම්පූර්ණ

සමාජ මෙහෙවරක් නැත හොත් පරිත්‍යාගයක් වේ. එපමණක් නොව යුග දිවියට ඇතුළත් වන අඹු සැමියන්ගේ විඩා බර ඒකාකාරී ජීවිතයට මානසික සංහිඳියාවක් ආස්වාදයක් තිබිය යුතු වේ. යුග දිවියේ අග්‍ර ඵලය වන්නේ දරුවා ය. දෙමාපියන් දෙදෙනෙකු දරුවෙකුගෙන් ලබන ආස්වාදය මෙපමණකැයි ප්‍රමාණය කර දක්විය නොහැකි තරම්ය. තමන් බිහි කර කවා පොවා රැකබලාගෙන අනුයෝජනය කොට අභිමානවත් පුරවැසියෙකු ලෙස සමාජය වෙත යොමු කිරිම වෙනුවෙන් කෘත ගුණ සැලකීමක් වශයෙන් සදාචාර සම්පන්න මිනිසා එකී දෙමාපියන් විය පත් වූ කල් හි ගෞරවයෙන් රැක බලා ගනු ලැබේ. තවද කිසියම් සමාජයක අලුතින් වගකීම් භාර ගන්නා සාමාජිකයින් වෙනුවෙන් ඒ වන විටත් සියල්ලෙන් පරිපූර්ණ වූ සමාජයක් ගොඩ නගා ඇත. එනම් ගේ දොර කෙත්වත් කර්මාන්ත බඩු මුට්ටු යාන වාහන ආදී වශයෙනි. රටක අර්ථ ක්‍රමය යනු මේ සියල්ලෙහි එකතුවයි. වර්තමානයේ දී වියපත් ව විශ්‍රාම සුවයෙන් පසුවන මහල්ලන්ගේ දහඩිය කඳුලු දූවැන්ත ගොඩනැගිලි කර්මාන්තශාලා ගොවිපලවල් නගර ආදී වශයෙන් වු ආර්ථික සම්පත් බවට පෙරලී මෙලෙස අභිමාණයෙන් නැගී සිටී. වත්මන් පරපුර වෙනුවෙන් පරිපූර්ණ ශිෂ්ටාචාරයක් ගොඩ නගා තැබූ වයෝවෘද්ධ වැඩිහිටියන් වෙනුවෙන් දූ දරුවන්ගේ ප්‍රණාමය හා ගරු සත්කාර මෙන්ම රැකවරණය ද හිමි විය යුතු වේ. එපමණක් නොව මෙහි තවත් වටිනා සමාජ කෘත්‍යයක් ද වේ. එනම් අනාගත සමාජ වගකීම් භාර ගැනීමට සිටින බාල පරපුරට ඔවුන් අබිමුව මෙලෙසින් සිදුවන වැඩිහිටි සත්කාරය අගනා මග පෙන්වීමක් වීමයි. කිසියම් පරම්පරාවකට අයත් වැඩිහිටියන් ඔවුන්ගේ දූ දරුවන් විසින් නොසලකා හරින්නේ නම් එය ඒ වන විට අනුයෝජනය වෙමින් හැදෙන වැඩෙන ළා බාල පරපුරට වැරදි ආදර්ශයක් වනු ඇත. එම දරුවන් ද මතු අනාගතයේ කිසියම් දිනක වගකිව යුතු පුර වැසියන් බවට පත් වනු ඇත. එවිට ඔවුනට තම දෙමාපියන් ඔවුන්ගේ වියපත් දෙමාපිය වැඩිහිටියනට සැලකූ ආකාරය නිරායාසයෙන් සිහියට නැගෙනු ඇත. එහි දී එම දරුවන් ද එම මතකයේ රැඳී ඇති ආදර්ශයට අනුව තම වියපත් දෙමාපියනට සැලකීම





අතිශයින් ම සාමාන්‍ය හැසිරීමක් වනු ඇත. සිය දෙමාපියන් නොසලකා හැරීම අසාධාරණ හෙයිනි. තම දෙමාපියන් විසින් එවැනි ආදර්ශයක් ක්‍රියාවෙන් ඔප්පු කොට දක්වා නො තිබුන හෙයිනි. සමාජීය වටිනාකම් බිඳ නො වැටෙන අයුරින් ආරක්ෂා කර ගනිමින් සදාචාර සම්පන්න ශක්තිමත් සමාජයක් සඳහා වූ අභිලාශය මුදුන්පමුණුවා ගැනීමේදී වැඩිහිටියන් හට ගෞරවාන්විත අයුරින් සලකා රැක බලා ගැනීම කොතරම් වැදගත් වන්නේද යන්න මෙයින් පැහැදිලි වේ.

විරාත් කාලයක් මුළුල්ලෙහි සාම්ප්‍රදායික සිංහල සමාජය වැඩිහිටියනට දේවත්වයෙන් සලකා ඇත්තේ මේ සියලු සාධක පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත ව යැයි කිව හැකි ය. ජීවිතයේ වැදගත් සෑම අවස්ථාවකදී ම ප්‍රමුඛස්ථානය ප්‍රදානය කරන ලද්දේ වයෝවෘද්ධ නැතහොත් වැඩිහිටි භාවයට අනුවයි. මඟුල, කොටහළුව, නම් තැබීම, පිරිත, පිංකම, සිංහල අවුරුද්ද වැනි බොහෝ අවස්ථාවන්හිදී වැඩිහිටියාගේ මූලිකත්වය ඉතා ඉහළින් අගය කොට සලකන ලදී. එවැනි අවස්ථාවකදී සියලු කටයුතු සිදුවූයේ බොහෝ ඇසූ පිරූ තැන් ඇති මෙකී වයෝවෘද්ධ වැඩිහිටියන්ගේ මග පෙන්වීමට අනුවයි. වැඩිහිටි වයසට පත් වූ දූ දරුවන් පවා වැදගත් ඕනෑම කටයුත්තක දී සිය වියපත් දෙමාපිය වැඩිහිටියන්ගෙන් ගුරුහරුකම් ලබා ගැනීමට අමතක නො කලහ. එමගින් සිදු වූයේ වැඩිහිටියාට හිමි නිසි ස්ථානය ප්‍රදානය කිරීක් ගෞරව ප්‍රණාම දක්වීමත්ය. එපමණක් නොව හේනේ කුඹුරේ අස්වනු ගෙට ගත් සෑම අවස්ථාවකදී ම සාම්ප්‍රදායික සිංහල සමාජයේ වැසියනට පළමු කොට සිහි වූයේ ත්‍රිවිධ රත්නයයි. දෙවනුව ස්වකීය දෙමාපිය වැඩිහිටියන් ය. අලුතින් ගෙට ගත් අස්වනු පරිභෝජනයට ගැනීමට පෙර මා පියන් හට අළුත් සහල් බත් පිළිගැන්වීම අතීතයේ සිට පැවත එන උතුම් චාරිත්‍රයකි. මාස ගණනාවක් තිස්සේ දිවා රාත්‍රි දෙකේ හි වෙහෙස මහන්සියෙන් උපයා ගත් භව භෝග ගෙට ගත් සැනින් ත්‍රිවිධ රත්නයට පසු මෙලෙස වැඩිහිටියන් පිදීමෙන් පැහැදිලි වන්නේ කොතරම් හරවත් සදාචාර ගති සිරිත් වලින් සිංහල සමාජය පරිපූර්ණ ව තිබුයේ ද යන්නයි.

කෙසේ වෙතත් මෙම නිෂ්පාදන ක්‍රියාවලියේදී වයෝවෘද්ධ වැඩිහිටියන්ගෙන් ඉතාමත් වටිනා කාර්ය භාරයක් ඉටු වූ බව අමතක කළ නොහැක. සෑම පවුලකම අඹු සැමියන් මෙන් ම ශ්‍රමයෙන් දායක විය හැකි සියළු දූ දරුවන් ද නිවසින් බැහැර ගොවිතැන් කටයුතු වල නිරත විය. එම. කාල සීමාවේ දී නිවෙස් රැක බලා ගැනීම මෙන් ම ළා බාල වියේ දූ දරුවන් රැක බලා ගැනීම ද අවලංගු වූ පුරවැසියන් ලෙස සලකා කොන් කිරීම වෙනුවට අපගේ සාම්ප්‍රදායික සමාජ ක්‍රමය මගින් මේ අයුරින් වැඩිහිටියන්ගේ කර පිට පැටවිනි. කිසිදු වටිනාකමකින් තොර අවලංගු වූ පුරවැසියන් ලෙස සලකා කොන් කිරීම වෙනුවට අපගේ සාම්ප්‍රදායික සමාජ ක්‍රමය මගින් මේ අයුරින් වැඩිහිටියන් නිසි තැන තබා විවිධ වැදගත් වගකීම් ද පවරනු ලැබීය. මෙවැනි සාමාජීය ප්‍රතිචාරයන් හමුවේ තව දුරටත් තමන් හට සමාජීය වශයෙන් වටිනාකමක් ඇති බව දකින වියපත් වැඩිහිටියන් හට අසීමිත මානසික තෘප්තියක් ලැබේ. අනාගත සමාජයේ හිමිකරුවන් වන බිළිඳු දරුවන් පිළිබඳ වගකීම අතිශය වැදගත් වේ. මන්ද දරුවා නිසියාකාරව හදා වඩා නොගත හොත් මුළු මහත් සමාජය ම බැරෑරුම් අභියෝගයකට ලක් වන හෙයිනි. මේ සා තීරණාත්මක වගකීමක් පවා දැඩි විශ්වාසයකින් යුක්තව පැවරීමට තරම් තවමත් වටිනා කියන පුරවැසියන් යැයි හැඟීයන හෙයින් ඔවුනට තමන් පිළිබඳ මහත් ආඩම්බරයක් හා සතුටක් දැනින. බටහිර ලෝකයේ වයෝවෘද්ධ පුරවැසියන් නිරතුරුව ගිලගත් අසන්තෘප්තිය කනස්සල්ල හා කාන්සාව වැනි බැරෑරුම් මානසික ව්‍යාධීන් සමීප නො වී ය. මෙම තත්ත්වය හමුවේ වර්තමානයේ දී මෙන් ළා බාල දරුවන් ඇති දැඩි කර ගැනීමද විශේෂ අර්බුදයක් නොවීය. තමන්ගේම දූ දරුවන් වුයෙත් ඉතාමත් ඕනෑකමකින් හා දැඩි සෙනෙහසකින් මෙම මුනුන් මිත්තන් විසින් සිය මුනුබුරු මිනිබිරියන් රැක බලා ගන්නා ලදී. මෙලෙස ඵලදායී පුරවැසියන් ලෙස සමාජයේ අවධානය මෙන් ම ගරු සත්කාර ද ලබමින් දරු මුනුබුරන් හා සමග ඉතාමත් ආස්වාද ජනක ජීවිතයක් ගත කරන ලද හෙයින් මොවුනට බටහිර කාර්මික සමාජවල වැඩිහිටියනට මෙන් තමන් කිසිදු වටිනාකමක් නැති එමෙන් ම





නොසලකා හරින ලද පිරිසක් ය යන මානසිකත්වයක් ඇති වුයේ නැත. නිරතුරු ව සොම්නසින් පසු වූ මොවුන් කොතරම් වයස්ගත වුව ද කායික හෝ මානසික වශයෙන් අබල දුබල වුයේ නැත. බොහෝ විට දියුණු යැයි සම්මත සමාජ වල වැඩිහිටියන් අතර සුලභව දක්නට ලැබෙන මානසික ආතතීන් හා ඒ මත පදනම් වූ රුධිර පීඩනය, අංශ භාගය, හෘද රෝග වැනි ව්‍යාදීන්ගෙන්ද මොවුනට පීඩාවක් එල්ල නොවීය. ජීවිතයේ අවසන් මොහොත දක්වාම මොවුන් ක්‍රියාශීලි පුරවැසියන් විය. සාම්ප්‍රදායික සිංහල සමාජය වයෝවෘද්ධ වැඩිහිටියන් කෙරේ දක්වන ලද ගරු සැලකිලි ඉතා ඵලදායී කායික හා මානසික චිකිත්සාවක් වුයේ යැයි කිවහොත් එය නිවැරදිය. දියුණු යැයි කියා ගන්නා වත්මන් ලෝකයෙහි වල්මත් වූ මිනිසුනට මෙයින් ගත හැකි ආදර්ශය ඉතා විශාලය.

වත්මන් ලෝකය තව දුරටත් ඉතා වේගයෙන් කාර්මිකරණ ක්‍රියාවලියට ගොදුරු වෙමින් පවතී. අනෙක් අතින් නාගරිකරණ ප්‍රවාහයට හසු වෙමින් පවතී. පොදු ජන ජීවන රටාවද මෙකී විපර්යාශයනට සාපේක්ෂ ව වෙනස් වෙමින් පවතී. මෙම තත්ත්වයන් හමුවේ සාම්ප්‍රදායික පවුල් ව්‍යුහය ද පෙරලියකට වෙනස් වෙමින් පවතී. මෙම තත්ත්වයන් හමුවේ සාම්ප්‍රදායික පවුල් ව්‍යුහය ද පෙරලියකට ලක්වන්නේ යැයි සමාජ විද්‍යාඥයින් විසින් තර්ක කරනු ලැබේ. එනම් සාම්ප්‍රදායික සමාජවල කේන්ද්‍රීය සමුහය වූ විස්තෘත පවුල න්‍යෂ්ඨික පවුල දක්වා විකාශනය වන බවයි. සරල ග්‍රාමීය සමාජයක දෙමාපිය දූ දරුවන් හා එම දරුවන්ගේ දරුවන්ද ඉතා සමීප ව ජීවත් වූ අතර සමාජීය අවශ්‍යතාවන් හි දී මෙන් ම ආර්ථික කටයුතු වලදී ද අන්‍යෝන්‍ය සහයෝගයෙන් එක්ව ක්‍රියා කරන ලදී. විවාහය දක්වාම සියළු දරුවන් දෙමාපිය සෙවනෙහි ජීවත් වූ අතර විවාහයෙන් පසු ඒ ආසන්නයෙහි වෙන්ව පදිංචි වීම සාමාන්‍ය සම්ප්‍රදාය විය. පෙනෙන තෙක් මානයේ මෙලෙස විසිරී යන ගැහැණු හා පිරිමි දරුවන් සෑම සමාජ හා ආර්ථික කටයුත්තකදී ම එකට ඒකරාශි වී සාමුහික හැඟීමෙන් ක්‍රියා කරනු

ලැබීය. ගොවිතැනේ දී බිම් සකස් කිරීම භෝග වැපිරීම ඒවා රැකබලා ගැනීම අස්වනු නෙලීම වැනි සෑම කාර්යයකදී ම පවුලේ ස්ත්‍රී පුරුෂ සාමාජිකයන් අවශ්‍යතාවය පරිදි ඒකරාශි විය. මඟුල, මරණය, පිරිත, පිංකම ලෙඩදුක වැනි සාමාජීය වශයෙන් වැදගත් වූ සෑම අවස්ථාවකදී ද ඔවුන් ඒ ආකාරයට ම සහයෝගයෙන් ක්‍රියා කරන ලද්දේ එකම පවුලක සාමාජිකයන් ලෙසිනි. වයෝවෘද්ධ භාවයට පත්වන දෙමාපියන් දෙදෙනා නිත්‍ය වශයෙන් ජීවත් වන්නේ මහ ගෙදර ය. එනම් ඔවුන් දෙදෙනා විවාහකයන් ලෙස සිය දූ දරුවන් හා සමගින් ජීවත් වූ නිවසෙහි ය. චිරාගත සිංහල ඥාති සම්ප්‍රදායයට අනුව මෙම නිවසේ ඊළඟ උරුමක්කාරයා බවට පත් විය යුත්තේ දරුවන් අතුරින් බාල ම පිරිමි දරුවා ය. ඒ වන විට සියළු වැඩිමල් ගැහැණු හා පිරිමි දරුවන් යුග දිවියට ඇතුළත් වී මහ ගෙදරින් වෙන් ව ගොසිනි. ඉන් අනතුරුව යුග දිවියට ඇතුළු වන බාල ම පිරිමි දරුවා සිය බිරිඳ හා සමගින් මහ ගෙදර පදිංචි වීම සාමාන්‍ය සම්ප්‍රදාය වේ. එතැන් සිට ඔහුගේ දෙමාපියන් දෙදෙනා ද ඔවුන් හා සමග මෙම නිවසෙහි ජීවත් වේ. නිත්‍ය වාසස්ථානය මහ ගෙදර වුවද ආසන්නයේ ජීවත්වන අනෙකුත් දූ දරුවන් වෙතද නිරතුරුව යාම් ඊම් කිරීම දෙමාපියන්ගේ සාමාන්‍ය පැවැත්මයි. එලෙස යාම් ඊම් කරන දෙමාපියන් තම දූ දරුවන්ගේ පවුල්වල කිසියම් අවශ්‍යතාවක් ඇති වූ සෑම විටෙකම හැකි පමණින් සහයෝගය දක්වීය. අනෙක් අතට වයෝවෘද්ධ දෙමාපියන් දෙදෙනාගේ ආහාරපාන ඇඳුම් පැළඳුම් බේත් හේත් යනාදී වශයෙන් වූ අවශ්‍යතාවන් සපුරා ලීම ද එක හා සමාන ව සියළු දරුවන්ගේ යුතුකම විය. විශේෂයෙන් ම වසරකට වරක් එළැඹෙන සිංහල අවුරුදු දිනයේදී අළුත් රෙදි පිළි ඇතුළු තෑගි භෝග ද රැගෙන සියළු දරුවන් සිය දෙමාපියන් බැහැදැකීමට මහ ගෙදරට පැමිණේ. ඒ හැරුණු විට නිති පතා සුව දුක් විචාරමින් ආහාර පාන ආදියෙන් සංග්‍රහ කරති. මෙලෙස දරු මුණුබුරන් පිරිවරා ගෙන පවුල නමැති ඥාති සමූහයාට මූලිකත්වය දුන් වැඩිහිටියන් කිසිවෙකුටත් බරක් නොවීය. ඔවුන් කායික හා මානසික සුවයෙන් පසුවුයේ මෙකී දරු මුණුබුරන්ගේ නිරන්තර සුහදශීලී ඇසුර හා ගරු සැලකිලි නිසාවෙනි. මේ





අයුරින් ජීවත් වූ වයෝවෘද්ධ දෙමාපියන්ගේ අවසානය සිදුවුයේ නිත්‍ය වශයෙන් ම ඔවුන්ගේ දරු මුණුබුරන් සෙවනෙහිය. ඔවුන්ගේ වෙන් වීම සැබවින්ම මෙකී දරු මුණුබුරන් හට පමණක් නොව සමස්ථ සමාජයටම දරා ගත නොහැකි පාඩුවක් හා වේදනාවක් විය. වැඩිහිටියකුගේ අභාවයේදී මුළු මහත් සමාජය මහත් සේ කම්පාවට පත් වුයේ එබැවිනි. මරණින් මතු ද ඔවුන් වෙනුවෙන් පින්කම් පවත්වා දානමාන ආදිය දෙමින් පින් අනුමෝදන් කරවනු ලබන්නේ මෙකී සුහදශීලී සම්බන්ධතාවයේ ප්‍රතිඵලයක් හැටියටය.

සමාජ ක්‍රමය සංකීර්ණත්වයට පත් වීමත් සමඟ ම මේ අයුරින් පරම්පරා තුනකට අයත් පවුලේ සාමාජිකයින් එක ම සමූහයක් හැටියට සමාජ ආර්ථික සහයෝගීතාවයෙන් එක් ව ජීවත් වෙනවා වෙනුවට එකිනෙකා පටු ඉලක්ක සොයා පවුලෙන් වෙන්ව බොහෝ දුර බැහැර ප්‍රදේශවල පවා විසරණය වීමට පටන් ගනු ලැබේ. මෙලෙස විසිර යන පවුලේ සාමාජිකයින් එකිනෙකා තම තමන්ගේ අභිමතය පරිදි ස්වාධීන පවුලක් ගොඩ නගා ගනු ලැබේ. එහි සාමාජිකත්වය දෙමාපිය දූ දරුවන්ට පමණක් සීමා වන අතර පෙර පැවති අයුරින් පළමු පරපුරේ වයෝවෘද්ධ සාමාජික සාමාජිකාවන් දක්නට නොමැත. දෙමාපියන් හා දූ දරුවන්ගෙන් සැදුම් ගත් මෙකී නව සමූහය සමාජ විද්‍යාඥයින් විසින් හඳුන්වනු ලබන්නේ න්‍යෂ්ටික පවුල යනුවෙනි. මෙලෙස රටක් තුළ හෝ විශ්වයේ විවිධ ප්‍රදේශවල විසිරි යන එක ම පවුල් සාමාජිකයින් හට තමන්ගේ යැයි කිව හැකි කෙනෙක් හමුවන්නේ ඉතාමත් කලාතුරකිනි. අසල්වාසීන් හෝ හිත මිතුරන් ලෙස නිරතුරු ව ගනුදෙනු පවත්වනුයේ අහම්බෙන් මුණ ගැසී එක්ව ජීවත් වන තන්නාදුනන පිරිසක් හා සමගය. පවුලක සියළු දරුවන් මෙලෙස උනුන්ගේ ඉලක්ක සොයා නිවසින් බැහැර වූ කල් හි එකී දරුවන් හදා වඩා ඔවුන් යහපත් මිනිසුන් කිරීමට ස්වකීය ජීවිතයේ වටිනා කාලය කැප කළ දෙමාපියන් දෙදෙනා ජීවිතයේ සැදෑ සමයේ කිසිදු පිළිසරණක් නැති අසරණයින් ලෙස හුදකලාවට පත් වේ. ලොවක් තැනීමට උරදුන් මිනිසුන් කාත් කවුරුවත් නැති වූ කල්හි අන්ත අසරණයන් බවට පත් වන්නේ ලෙස

දේපොළ මිළ මුදල් ගේ දොර යාන වාහන අතින් නොව මානසික වශයෙනි. කුඩා වියෙහිදී දරුවාගේ කායික හා මානසික සුවය සඳහා තවත් කෙනෙකුගේ සෙනෙහස කොතරම් වැදගත් වන්නේ ද එය ඒ ආකාරයට ම වියපත් වූ මිනිසාගේ කායික හා මානසික සුවය සඳහා ද අත්‍යාවශ්‍ය වේ. තමන් දෙස බැලීමට හෝ තමන්ගේ ඕනෑ එපාකම් පිළිබඳ සොයා බැලීමට කිසිවෙකුත් නොමැති වීමෙන් හුදකලා වන වැඩිහිටියන් පළමුව මානසික වශයෙන් රෝගී වන අතර එහි ප්‍රතිඵලය ලෙස ඉන් අනතුරුව කායික වශයෙන් ද රෝගී වෙමින් බෙලහීනතාවයට පත් වේ. මැක්වෙයි හා ෂොස්ටැක් විසින් පෙන්වා දුන් ආකාරයට මානසික පීඩනය කනස්සලු බව හා කාන්සාව වැනි මානසික අර්බුද ඇති වන්නේ බටහිර ලෝකයේ බහුල වශයෙන් දක්නට ලැබෙන මෙකී සමාජ පරිසරයේ ප්‍රතිඵලයක් හැටියටය. මේ වන විට ශ්‍රී ලංකාව වැනි රටවල ද නාගරික උසස් යැයි සම්මත සමාජවලින් ඇරඹී ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවත්නේ මීට අනුරූපී සමාජ රටාවකි. එබැවින් අනාගත සමාජය ද සෑම අතකින් ම මිනිසාගේ හිත සුව පිණිස පැවතිය යුතු යැයි අපේක්ෂා කරන මානව හිතකාමී සියළු මිනිසුන් මෙකී සමාජ ප්‍රවනතාවන් පිළිබඳ දැඩි සේ සැලකිලිමත් විය යුතුය.

අප වැනි සමාජ කාර්මිකරණය නො වුව ද එහි බලපෑමට හසු වීමේ ප්‍රතිඵලයක් ලෙස පවුලේ සාමාජිකයන් දස දෙස විසරණය වීමේ ප්‍රවණතාවක් වර්ධනය වෙමින් පවත්නා බව පෙනී යයි. කෙසේ වෙතත් පවුලේ සියළු දෙනා එක පොකුරට එක් ව ජීවත් වූ විස්තෘත පවුල වෙනුවට න්‍යෂ්ඨික පවුල් ක්‍රමය ආදේශ වීමත් සමගම වයෝවෘද්ධයන්ගේ ඛේදනීය අර්බුදය උද්ගත වන්නේ එහි අනිවාර්ය ප්‍රතිවිපාකයක් හැටියට දැයි විමසා බැලිය යුතු වේ. සමකාලීන නවීන සමාජය දෙස විමසිල්ලෙන් බලන කල දැකිය හැකි වන්නේ මෙකී ඛේදවාචකය වලකාලිය නො හැකි අනිවාර්ය තත්ත්වයක් නො වන බව ය. ස්වකීය දෙමාපිය වැඩිහිටියන් හා සමගින් ගත කිරීමට තරම් කාලයක් සොයා ගැනීම සිය කාර්ය බහුල ජීවිතය හමුවේ ඉතා දුෂ්කර වී ඇතැයි නාගරික ජීවිතයක් ගත කරනු ලබන බොහෝ දෙනා විසින් පෙන්වා දෙනු ලැබේ. එහෙත් සෑම වසරකම මෙකී පිරිස විවිධ





හරසුන් උත්සව, සැණකෙළි, ප්‍රීති සාද වෙනුවෙන් ඉතා විශාල කාලයක් කැප කරනු ලබන බව නො රහසකි. උපන්දින සාද, විවාහ සංවත්සර, සැණකෙළි, සමාජශාලා, තනතුරු උසස්වීම් සාද, සුහද හමුවීම් ආදි වශයෙන් එම අවස්ථා වර්ග කර දැක්විය හැකිය. මේ සියළු තැන් හි දී සිදු වනුයේ එකිනෙකාගේ පන්ති ප්‍රතිරූප හුවා දැක්වීම හා හුදු විනෝදාස්වාදය සඳහා කාලය හා ධන සම්පත් වැය කිරීම පමණි. ආත්මාර්ථකාමයෙන් ඇළලී ගිය මෙවැනි සමාජයක වැසියන් සියළු තීරණ තීන්දු ගනු ලබන්නේ ස්වාර්ථය ම අරමුණු කර ගෙන ය. යම් හෙයකින් මොවුනට පරිත්‍යාගශීලී ව කල්පනා කිරීමට හැකි වුව හොත් සිය දෙමාපිය වැඩිහිටි වයෝවෘද්ධයන්ගෙන් සැදි පරම්පරාව හා සම්බන්ධයෙන් උද්ගත ව ඇති සමාජ අර්බුදය ඉතා පහසුවෙන් නිරාකරණය කර ගැනීමට හැකි වනු ඇත. එවැනි උතුම් මිනිස් ධර්මතාවයන්ගෙන් හෙබි පරපුරක් බිහිකර ගැනීම සියළු මිනිසුන්ගේ වගකීමක් වේ. අද මෙකී පරිත්‍යාග කිරීමට තරම් පරාර්ථකාමී වන තැනැත්තා අනාගතය වෙනුවෙන් මිළ කළ නොහැකි සම්පතක් ආයෝජනය කරන්නෙකි. හරසුන් විනෝද උත්සව වෙනුවෙන් කැප කරමින් විනාශ කරනු ලබන වටිනා කාලය හා ධනය ඵලදායී කාර්යයක් වූ දෙමාපිය වැඩිහිටියන්ගේ සෙවනෙහි ගෙවීමට හා ඔවුන්ගේ ඕනෑ එපාකම් සොයා බැලීමට කැප කළ හොත් එවන් ආදර්ශවත් පුරවැසියන්ගේ දූ දරුවන් ද එය ගුරු කොට ගනිමින් මතු අනාගතයේදී සිය දෙමාපියන් ද ඒ අයුරින් කවා පොවා රැක බලා ගනු ඇත. මේ අනුව වයෝවෘද්ධ පරපුර හා සම්බන්ධයෙන් උද්ගත ව ඇති වත්මන් සමාජ ගැටලුව වළකා ගත නොහැක්කක් නොව අවශ්‍යතාවක් නොමැති කමේ හා නොසැලකිල්ලේ අනිවාර්ය ප්‍රතිඵයක් බව මැනවින් පැහැදිලි වේ. යුතුකම් හා වගකීම් නො හඳුනන මිනිසුන්ගෙන් සැදි සමාජයක මානව අයිතීන් පිළිබඳ නවීන නීතිවලින් පිළිසරණක් පැතීම හුදෙක් පලු පල්ලව පතා මහා වාලුකා කතරක වෙහෙස මහන්සියෙන් පැල සිටුවීමක් හා සමානය.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව - ජනගහන හා නිවාස සංගණන වාර්තා 1946, 1963, 1971, 1981
2. De Silva W.I. 1997, Population projection for Sri Lanka: 1991-2041, Institute of Policy Studies, Colombo.
3. United Nations 1999, The Family and Older persons in Bangladesh, Pakistan and Sri Lanka, Asian Population Stusies Series No. 151, New York.
4 Frank McVeigh and Aithur Shostak, 1978, Modern Social Problems. Holt, Rinehart and Winston, New York.
5. Kart Cary,S., and Barbara Manard., 1976, Aging in America; Reading in Social Gerontology, New York : Alfred.
6. Spencer Marian, G., and Caroline J. Dorr., 1975, UnderstandingAging: A Multidisciplinary Approach, Englewood Cliffs, N.J., Prentice Hall.